# ස්වයං අධ්‍යනයට අත්වැලක්

ශ්‍රේණිය - 07

වාරය - තුන්වන වාරය

නිපුණතා මට්ටම - 6.2 වෙනත් සංස්කෘතිවලට අයත් නර්තන අංගවල සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම - **කරගම් කාවඩි නැටුම් අගයමු**





සැකසුම - G.G.P.මංජුලා කුමාරි
මප/වත්/විමලරත්න කුමාරගම මහා විද්‍යාලය.

මෙහෙයවීම - නර්තන අංශය.
වත්තේගම අධ්‍යාපන කලාපය

උපදෙස් - මෙය ලිඛිත පාඩමකි. මෙය වැඩි දුරටත් අධ්‍යනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබාගත යුතුයි.

හැඳින්වීම - අපට ආවේනික වූ දේශීය ගැමි නර්තනයෙන් පමණක් නොව වෙනත් වෙනත් සංස්කෘතීන් හිද ගැමි නර්තනයන් බොහෝමයක් දැක ගත හැකිය. එවැනි ගැමි නැටුම් දෙකක් පිළිබඳව අප 6 ශ්‍රේණි යේදී ඉගෙන ගත්තෙමු. එනම් සෙම්බු (කළ) , කෝලාට්ටම් (ලී කෙලි) වශයෙනි. මෙම පාඩමෙන් අප බලාපොරොත්තු වන්නේ කරගම්, කාවඩි යන ද්‍රවිඩ ගැමි නර්තනයන් පිළිබඳ සාකච්ඡා කිරීමටය.

★ කරගම්

★ කාවඩි



created by Chathura.com(071 939 2 185)

# කරගම් නැටුම

ඉන්දියාවේ ගැමි නැටුම් අතරින් සුවිශේෂ වූ ගැමි නැටුමකි. තමිල්නාඩු ප්‍රාන්තය මුල් කරගෙන මෙහි ආරම්භය සිදුවූ අතර තන්ජාවූර් ප්‍රදේශයේ ආගමික පුද පූජා අවස්ථාවන්හීදී දක්නට ලැබේ.




★ පුදලබන දෙවිවරු

මාරි අම්මාන් හා ගංගා අම්මාන් දෙවිවරු

★ උත්සව පවත්වන කාලසීමාව.

අගෝස්තු මාසය තුල ඉන්දියාවේ හා ලංකාවේ පැවැත්වෙන උත්සවයකි.

# කරගම් නැටුම හා බැඳි සුවිශේෂ ලක්ෂණ

★ සමබරතාවය තබා ගනිමින් නර්තනයේ යෙදීම මෙහි විශේෂත්වයකි.

★ සමබරතාවය සඳහා කළයක් හිසමත තබාගෙන සරල චලන භාවිත කරමින් නර්තනය කරයි.

★ ස්ත්‍රීන් සහ පුරුෂයන් යන දෙපක්ෂයම සහභාගි වන අතර තනි තනිව හා යුගල වශයෙන් නර්තනයේ යෙදෙයි.

★ ලෝහ වලින් හෝ මැටිවලින් හෝ සකස්කරන ලද කළය විවිධ වර්ණයෙන් යුත් මල් වර්ග වලින් සරසනු ලැබේ.

★ රතු, සුදු, කහ, මල් වැඩි වශයෙන් අලංකාරය සඳහා යොදා ගැනේ.







★ කළය මුදුනේ කඩදාසි වලින් සකස්කරන ලද ගිරවෙකුගේ ආකෘතියක් දැකිය හැකිය. එම ගිරවා කැරකෙන ආකාරයට කළය හිස මුදුනේ තබා ගනී.







★ සමබරතාවය පවත්වා ගැනීම සඳහා කළය ඇතුලට සහල් දමනු ලැබේ.

★ මල් වලින් සරසන ලද කළයේ කවාකාර බව ඉස්මතු කිරීමට බම්බු ලීයක් කළය තුලට සිරස් අතට දමා එය වටා මල් වැල්වලින් අලංකාර කර නර්තනයේ චමත්කාර බව වැඩිකර ගැනේ.



created by Chathura.com(071 939 2 185)

# සංගීතය හා වාද්‍ය භාණ්ඩ

- ★ බෙර වර්ග හා නළා වර්ග සංගීතය සඳහා යොදා ගනු ලබයි.
- ★ නෙයඩ් මේලම් සංගීතය සුවිශේෂ කොට ගනියි. ඇතැම් අවස්ථාවන්හීදි ගායනය සඳහා ගීතද යොදා ගැනේ.





(නෙයඩ් මේලම්)

## රංග වස්ත්‍රාභරන

★ දමිළ ලක්ෂණ පෙන්නුම් කරන සාරිය නොහොත් දිග සාය , හැට්ටය හා ආභරණ කාන්තාවන් සඳහා භාවිතා කරයි.

★ පිරිමි නර්තනයන් ජෝතිය හා පුන නූල භාවිතය දක්නට ලැබේ. මෙහිදී රතු , කහ , කොළ , යන වර්ණ වැඩි වශයෙන් යොදා ගනු ලැබේ.






## ආගමික පසුබිම.

★ දේව භක්තිය ප්‍රකාශ කිරීම මෙන්ම සේවාශිර්වාදය ගබා ගැනීම කරග් නර්තනයේදී ද්‍රවිඩ ජනයා අරමුණු කරයි.

★ කන්නගි හෙවත් පත්තිනි දේවියද පුද පූජා වට ලක්කරනු ලබයි.

★ දෙවියන්ගේ ලෙඩ ලෙස සැලකෙන පැපොල, සරම්ප, වැනි රෝගවලින් වැළකීමට කරගම් නර්තනයෙන් හැකි වන බව විශ්වාසයෙන් රඟ දැක්වීම් සිදු කරයි.

# කාවඩි නැටුම

කාවඩි නර්තනය ද්‍රවිඩ ජනතාව විසින් අදහනු ලබන මුරුගන් හෙවත් කතරගම දෙවියන්ට භක්තිය දැක්වීම සඳහා කරනු ලබන නර්තනාංගයකි.



★ කාවඩි නර්තනයේදී නරපිට තබා ගන්නා මෙවලම කාවඩි කූඩුව නමින් හඳුන්වනු ලබයි.

★ කිරි කාවඩි , භක්ති කාවඩි , පරවි කාවඩි , මත්ස්‍ය කාවඩි , ගිනි කාවඩි යනුවෙන් කාවඩි වර්ග 5 කි.





# කාවඩි නැටුම හා බැඳි සුවිශේෂ ලක්ෂණ

★ මෙම නැටුමෙහි යෙදෙන්නන් එකිනෙකා තම දක්ෂකම් දක්වමින් නර්තනයේ යෙදෙයි.

★ මොනර පිල්වලින් සහ වෙනත් විසිතුරු සැරසිලි වලින් සරසන කාවඩිය කරමත තබා නර්තනයේ යෙදෙයි.

★ කාවඩිය සමබර කරමින් , කරකවමින් විවිධ චලන රටාවන්ට අනුව හසුරුවමින් නර්තනය සිදු කරයි.

## ආගමික පසුබිම.

★ මුරුගන් කෝවිල් ආශ්‍රිතව දියුනු වූ මෙම කාවඩි නර්තනය දේව භක්තිය උදෙසාම සිදු කරනු ලබයි.

★ ද්‍රවිඩ ජනයා දෙවියන් උදෙසා තම භාර භාර ඔප්පු කිරීම පිනිසද මෙම කාවඩි රඟ දක්වයි.

★ කාවඩි නර්තනය අවසානයේදී දානයක් දීමද ආගමානුකූලව සිදු කිරීම විශේෂත්වයකි.

